# බලය බෙදීම අවශ්‍ය කාට ද?

දෙමළ ත්‍රස්තවාදය තව සති කිහිපයකින් පරාජයවීම නියත ය. එහෙත් එයින් කියැවෙන්නේ දෙමළ බෙදුම්වාදය හා දෙමළ ජාතිවාදය පරාජය වී ඇති බව නො වෙයි. මෙරට පළමුව ඇතිවූයේ දෙමළ ජාතිවාදය ය. ඉන් පසුව දෙමළ ජාතිවාදයෙන් දෙමළ බෙදුම්වාදයත් එහි ප්‍රතිඵලයක් ලෙස දෙමළ ත්‍රස්තවාදයත් බිහිවිණි. බිහිවීම ඒ අයුරින් සිදුවුවත් පරාජයවීම හා විනාශවීම අනෙක් පැත්තට සිදුවීම න්‍යායානුකූල ය. පළමුව ත්‍රස්තවාදයත් ඉන් පසුව බෙදුම්වාදයත් අවසානයේ දී දෙමළ ජාතිවාදයත් පරාජය කළයුතුව ඇත.

දෙමළ බෙදුම්වාදයට අවශ්‍යවන්නේ මූලික වශයෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල වෙනම දෙමළ රාජ්‍යයක් බිහිකිරීම ය. එහෙත් බටහිරයන්ගේ ආධාරය හා අනුග්‍රහය ලබන ඔවුන් විසින් ඇතිකරනු ලැබ පෝෂණය කෙරුණු දෙමළ බෙදුම්වාදයට මුළු මහත් ලංකාව ම යටත්කරගැනීමේ වුවමනාවක් තිබූ බව දැන් පැහැදිලි ය. අද මුලතිවුහි හා ඒ අවට හමුවී ඇති ආයුධ, සබ්මැරීන හා වෙනත් උපකරණවලින් හා ආයුධ නිපදවන කම්හල්වලින් පැහැදිලිවන්නේ ඒ බොහෝමයක් බටහිරයන් විසින් සපයනු ලැබ ඇති බවත් බටහිරයන්ගේ අවශ්‍යතාවකට ද අනුව කටයුතු කරමින් දෙමළ වෙදුම්වාදීන් උතුරු හා නැගෙනහිර පළාත් පමණක් නොව මුළු රටම සිංහලයන්ට අහිමිකිරීමේ සූදානමකින් සිටි බවත් ය. අප කලින් ද සඳහන්කර ඇත්තේ මෙවර මෙහෙයුම් තව වසරකින් පමණ පමා වී නම් දෙමළ ජාතිවාදීන් මුළු රටේ ම නායකයන් වීමට තිබුණු බව ය. දෙමළ ජාතිවාදයට බ්‍රිතානි සමයේ දී ද අවශ්‍ය වූයේ අරුණාශලම් රාමනාදන් වැනි නායකයන් බ්‍රිතානීන්ගේ අනුදැනුම ඇතිව රටේ ම නායකයන් බවට පත්කිරීම ය.

දෙමළ ජාතිවාදය මුලින් ම පැතුරුණේ ඉංගිරිසි කතාකරන ධනවත් දෙමළ ජනවාර්ගික වෙල්ලයන් අතර ය. ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා ගෙන්වනු ලැබූ වෙල්ලාලයේ පසුව ඉංගිරිසි අධ්‍යාපනයක් ලැබූහ. බ්‍රිතානීන් විසින් උඩට තල්ලු කරනු ලැබූ වෙල්ලාල පවුලක් රටේ ම බලය ලබාගැනීම සඳහා සූදානම් විය. දෙමළ ජනවර්ගයට, විශේෂයෙන් ම යාපනයේ වෙල්ලාලයන්ට වෙනත් කිසිවකුට නොලැබුණු වරප්‍රසාද බ්‍රිතානීන්ගෙන් හිමිවිය. සිංහලයන්ට, විශේයෙන් ම සිංහල බෞද්ධයන්ට අහිමි වූ වරප්‍රසාද දෙමළ වෙල්ලයන්ට ලැබිණි. ඒ සමග දෙමළ ජනයා සිංහලයන්ට වඩා උසස් ය යන හැඟීම ඉංගිරිසි උගත් දෙමළ ජනයා අතර ඇතිවිණි.

මුළු රටේම නායකයන් වීමට වෙල්ලායන්ට තිබූ බලාපොරොත්තුව කැඩී ගියේ සර්වජන ඡන්දය මෙරට වැසියන්ට ලැබීමත් සමග ය. ඉන් පසුව තමන්ට තිබූ වරප්‍රසාද එකිනෙක ගිලිහී යැම දෙමළ වෙල්ලාල උගතුන් විසින් අර්ථකථනය කරනු ලැබුයේ සිංහලයන් විසින් කරන ලද අසාධාරණයක් ලෙස ය. බටහිරයන්ගේ ආධාරයෙන් දෙමළ ජාතිවාදීහු මේ අසාධාරණය පිළිබඳ කතාව ලෝ පුරා ප්‍රචාරය කළහ. ඇත්තට ම ඒ ප්‍රචාරය කෙරුණේ බටහිරයන් අතිනි. එහි දී බටහිරයෝ විශේෂයෙන් ම බ්‍රිතානීහු බීබීසිය ගාඩියන් වැනි ඊනියා ප්‍රබුද්ධ ජනමාධ්‍ය සිංහලයන්ට එරෙහිව යොදාගත්හ.

බටහිරයන් විසින් දෙමළ ජාතිවාදය මුලින් ම ඇතිකරනු ලැබුයේ ඉංගිරිසි උගත් දෙමළ ජනයා අතර ය. මුළු ජනගහනයෙන් දෙමළ ප්‍රතිශතය සියයට දොළහකටත් අඩුවුවත් ඉංගිරිසි කතාකරන්නන් අතර දෙමළ ප්‍රතිශතය ඉතා වැඩිවිය. ඉංගිරිසි කතාකරන සිංහලයන්ට වඩා ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා වැඩි විය. රජයේ රැකියාවල, වෘත්තීන්හි යෙදුණු දෙමළ ජනයා එසේ යෙදුණු සිංහලයන්ට වඩා වැඩිවිය. මේ සියල්ලත් බ්‍රිතානීන්ගෙන් ලැබුණු ආධාරත් හේතුකොටගෙන රටේ නායකත්වය දෙමළ වෙල්ලායන්ට හිමිවිය යුතු බවට මතයක් ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා අතර ඇතිවිය. එහෙත් සෝල්බරි ව්‍යවස්ථාවෙන් පසු ඒ සියල්ල කණපිට පෙරළිණි. දෙමළ උගතුන් උතුරු හා නැගෙනහිර පළාත්වලට බලය බෙදිය යුතු යැයි කීමට පටන්ගත්තේ ඉන් පසුව ය.

දෙමළ උගතුන් ඒ මතයට ඇද දමා ඇත්තේ 1949න් පසුව චෙල්වනායගම් විසිනි. කලින් ම සිටි දෙමළ නායකයන්ගෙන් දෙමළ ජනවාර්ගිකයන්ගේ ප්‍රශ්නවලට නිසි විසඳුම් ලැබී නොමැති බව කියමින් දෙමළ තරුණයන් අවි අතට ගත්තේ 1971 න් පසුව ය. මේ තරුණයෝ මුල දී දෙමළ ජාතිවාදීන්ට අපේ කොල්ලෝ වූහ. ඉංගිරිසි උගත් දෙමළ නායකයන් විසින් උසිගන්වනු ලැබූ මේ තරුණයෝ වෙල්ලාලයෝ ම නො වූහ. ප්‍රභාකරන් කරෙයිවර් කුලයේ ඉංගිරිසි

© Prof. Nalin De Silva

කතානොකරන්නෙක් වෙයි. ඔහු යථාකාලයේ දී වෙල්ලාලයන්ට ද ප්‍රශ්නයක් විය. අපේ කොල්ලෝ යන ආදර වදනින් අමතනු ලැබුවෝ ආදර වදන් තෙපළුවන් ද මරා දැමුහ. දෙමළ ජාතිවාදය මුල සිට ම හින්දු චින්තනයෙහි නොව කතෝලික චින්තනයෙහි පදනම් විය. ඇතැම් උගත් හින්දු වෙල්ලායන්ට පමා වී වුව ද සිදු වී ඇත්තේ කුමක් ද යන්න අවබෝධවීමට පටන්ගති. එහෙත් ඒ අවබෝධය වුව ද බොහෝ දෙනකුට ඇතිවූයේ ත්‍රස්තවාදය සම්බන්ධයෙන් පමණකි. ඔවුහු බොහෝදෙනෙක් තවදුරටත් බෙදුම්වාදය පිළිගත්හ. ආනන්ද සංගරි වැන්නෝ මේ සම්බන්ධයෙන් උදාහරණ වෙති.

යාපනයේ දෙමළ ජාතිවාදීහු කිසිදිනෙකත් ඔවුන්ට පසුව කෘෂිකාර්මික කම්කරුවන් ලෙස නොව කුලීකරුවන් ලෙස ලංකාවට ගෙන ආ අයගෙන් පැවතෙන නැගෙනහිර දෙමළ ජනයාට නිසි සැලකිල්ලක් නො දැක්වූහ. එහෙත් සිංහල විරෝධී සටනෙහි දී ඔවුන්ගේ වැදගත්කම දුටු චෙල්වනායගම් ඔවුන් ද එකතුකරගැනීමට කටයුතු කෙළේ ය. ප්‍රභාකරන් යටතේ ද ඒ එකතුව ක්‍රියාත්මක විය. එහෙත් ඒ උඩින් පමණක් ක්‍රියාත්මක වූ ගැඹුරක් නැති එකතුවක් විය. ප්‍රභාකරන් ද වෙල්ලාලයකු නොවුව ද නායකත්වය උතුරට සීමාකිරීමට වග බලාගත්තේ ය. එහි ප්‍රතිඵලය වූයේ උතුරු හා නැගෙනහිර පළාත්වල දෙමළ එකතුව කැඩී යෑම ය. නැගෙනහිර කැඩුණු කොටස අද වන විට තවත් කොටස්වලට කැඩී ඇත. ඒ එක් කොටසකට නායකත්වය දෙන කරුණා අම්මාන් හෙවත් මුරලිදරන් ඇමතිවරයාට අද තව දුරටත් බලය බෙදීමක් අවශ්‍ය නොවේ. ඔහු හා පිරිස ශ්‍රී ල නි පක්ෂයට බැඳී ඇති අතර ඔවුන් දෙමළ බෙදුම්වාදයෙන් පමණක් නොව දෙමළ ජාතිවාදයෙන් ද කැඩී ඇතැයි විශ්වාස කළ හැකි ය.

පිටරට විසිරී සිටින දෙමළ උගතුන් බටහිරයන්ගේ අනුදැනුම ඇතිව අද ඊනියා වධක කඳවුරු, දෙමළ සිවිල් ජනයා ඝාතනය කිරීම්, දෙමළ ජනවර්ගය සමූලඝාතනය කිරීම් ආදිය ගැන කතාකරන්නේ ඔවුන් සිතන අයුරින් මුලතිව් හි කොටු වී ඇති ප්‍රභාකරන් බේරාගැනීමටත් පසුව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු පිරිසකට යුද අපරාධකරුවන් ලෙස චෝදනාකර වැරදිකරුවන් කිරීමටත් ය. යමකු යුද අපරාධකරුවකු වන්නේ ඊනියා නීතියක් අනුව නොව ඇමරිකන් ප්‍රතිපත්තියට එකග නොවන්නේ ද යන්න මත ය. ජපානයට පරමාණු බෝම්බ හෙළීමට, වියට්නාමයේ අහිංසක ජනයා මරා දැමීමට, ඇෆ්ගනිස්ථාන ඉරාකය ආදී රටවල සිවිල් ජනයාට ද බෝම්බ දැමීමට තීරණය කළ ඇමරිකන් ජනාධිපතිවරු යුද අපරාධකරුවන් ලෙස නො සැලකෙති. බටහිරයන් තම ප්‍රතිපත්තිවලට විරුද්ධ රාජ්‍ය නායකයන් පමණක් යුද අපරාධකරුවන් ලෙස සලකන බව පැහැදිලි ය. බටහිරයන්ගේ හා පිටරට සිටින දෙමළ උගතුන්ගේ මතය කුමක් වුවත් උතුරු පළාතේ දෙමළ ජනයා ප්‍රභාකරන්ගේ වදයෙන් මිදී පැමිණෙන්නේ ඊනියා යුද අපරාධජරුවන් වෙත ය. මේ අහිංසක දෙමළ ජනයාට ඊළමක් හෝ බලය බෙදීමක් හෝ අවශ්‍ය නොවේ. ඔවුන්ට අවශ්‍ය සිංහලයන් සමඟ එකතු වී අනුකලිත ජාතිය වර්ධනය කිරීමටත් තමන් ජීවත්වන ප්‍රදේශ සංවර්ධනය (ඒ කුමක් වුවත්) කරගැනීමටත් ය.

එසේ නම් අද බලය බෙදීමක් අවශ්‍ය කා හට ද? අද ඒ අවශ්‍යවන්නේ බටහිරයන්ට (බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට), ඉන්දියානුවන්ට, පිටරට හා මෙරට සිටින දෙමළ ජාතිවාදී උගතුන්ට, සිංහල බෞද්ධයනට වින කිරීමට බලා සිටින ඇතැම් කතෝලික හා ක්‍රිස්තියානි පූජකයන්ට හා ප්‍රභූවරුන්ට, දේශපාලනයේ නන්නත්තාර වී සිටින කසිකබල් මාක්ස්වාදීන්ට හා ලිබරල්වාදීන්ට, ජනමාධ්‍යයෙහි හා වෙනත් තැන්වල ඇති බොරු ප්‍රබුද්ධයන්ට හා රාජ්‍ය නොවන බැළයන්ට ය. සංඛ්‍යාත්මක ව ඔවුහු එතරම් විශාල පිරිසක් නො වෙති. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දාසයන් වූ කසිකබල් මාක්ස්වාදීන් ඇතුළු මේ සියළු දෙනාට මෙරට සමාජයෙහි මතවාදී ආධිපත්‍යයක් හිමිවන්නේ ඔවුන් දක්ෂයන් වූ නිසාවත් ඔවුන් ඊනියා සාධාරණත්වයක් වෙනුවෙන් පෙනී සිටින නිසාවත් නොව බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි සංස්කෘතික ආධිපත්‍යය හේතුවෙනි. ඔවුන් සියළු දෙනාට ම වූ පොදු ලක්ෂණයක් වෙයි. ඒ අන්කිසිවක් නොව විවිධ හේතු නිසා ඒ ඒ අයට ඇති සිංහල බෞද්ධ සංස්කෘතියට වූ විරුද්ධත්වය ය. ඒ ඒ අයට සිංහල බෞද්ධ සංස්කෘතියට ඇති විරුද්ධත්වය එකම නොවුවත් ඒ සියළු දෙනා ඉන් බැඳී සිටිති. කසිකබල් මාක්ස්වාදීන්ට ලිවරල්වාදීන්ට හා කතෝලික ක්‍රිස්තියානි පූජකවරුන්ට උතුරු හා නැගෙනහිර පළාත්වලට බලය බෙදීම සම්බන්ධයෙන් එක් වේදිකාවකට පැමිණීමට හැකි වී ඇත්තේ එබැවිනි. දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමත් සමග අප පිවිසෙන්නේ මේ සුළු පිරිසෙහි ආධිපත්‍යය පරාජය කිරීමේ සටනට ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva